අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறிப்பு / My Ref. PMO/RRPCM/2025/decision
ඔබේ යොමුව / உமது குறிப்பு / Your Ref.
දිනය / திகதி / Date 2025.12.11

**ඉතා වැදගත්**

**සියලුම අමාත්‍යාංශ, කොමිෂන් සභා සහ ස්වාධීන ආයතන ප්‍රධානීන් වෙත,**

**රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය කමිටුවේ තීරණ දැනුම් දීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2025.09.25 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. එම ලිපියේ දෙවන ඡේදය අනුව, විධිමත් මානව සම්පත් ඇගයීමක් සිදු කිරීමෙන් අනතුරුව ඔබ ආයතනයේ පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අදාළව මෙම කමිටුවේ නිර්දේශය පිණිස ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ දී, එකී පුරප්පාඩු සඳහා නව බඳවාගැනීම් සම්බන්ධ ඉල්ලීම් පමණක් ඉදිරිපත් කළ යුතු බවත්, දීප ව්‍යාප්ත සේවා, ඒකාබද්ධ සේවා සහ අභ්‍යන්තර උසස්වීම් හරහා සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු සම්බන්ධ ඉල්ලීම් පිළිබඳව මෙම කමිටුව මඟින් සළකා බැලීමක් සිදු නොකරන බවත්, ඔබ වෙත දැනුම් දී ඇත.

03. එමෙන්ම, ඉහත අභ්‍යන්තර උසස්වීම් හරහා සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු සම්බන්ධ ඉල්ලීම් ලෙස සඳහන් කර ඇත්තේ ශ්‍රේණිගත උසස්වීම් ඇතුළත් ඒකාබද්ධ කරන ලද තනතුරු බවත්, එම ඉල්ලීම් මෙම කමිටුවේ නිර්දේශ සඳහා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් නොමැති බවත්, කාරුණිකව දන්වමි.

04. තවද, නව තනතුරු සඳහා බඳවාගැනීම් සිදු කිරීමේදී රාජ්‍ය සේවයේ සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින බොහෝ තනතුරු සඳහා විවෘත පදනම මත බඳවාගනු ලබන අතර, එම ආයතනවල ඉහළ තනතුරු සඳහා පත්කිරීම් සිදු කරනු ලබන්නේ බාහිර හා අභ්‍යන්තර ක්‍රමවේද මඟිනි.

05. එහෙයින්, ඉහළ තනතුරු සඳහා අභ්‍යන්තර ක්‍රමවේදය යටතේ බඳවාගැනීම් සිදුකිරීමේදී නව වැටුප් කේත යටතේ අනුමත නව තනතුරක් සඳහා බඳවාගැනීම් සිදු කිරීමට අපේක්ෂිත නම් එකී තනතුරු බඳවාගැනීම් පිළිබඳ ඉල්ලීම් රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ නිලධාරී කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු බව තවදුරටත් කාරුණිකව දන්වනු රිසියෙමි.

**ප්‍රදීප් සපුතන්ත්‍රී**
අග්‍රාමාත්‍ය ලේකම්
සභාපති, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ නිලධාරී කමිටුව

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
3. විගණකාධිපති

} කරු. දැ.ගැ.ස.

4. අමාත්‍යාංශ ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
8. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

} කරු. දැ.ගැ.ස. සහ අ.ක.ස.

කාර්යාලය / அலுவலகம் / Gen. Office: 2575317, 2575318
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2574143, 2575454, 2575310
විද්‍යුත් තැපැල / ஈ மெயில் / E - mail: secpm@pmoffice.gov.lk